**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වන වගන්තිය යටතේ වන නියෝග**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නිර්දේශ මත, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මා විසින් මෙහි පහත දක්වනු ලබන විදුලිබල (උපයෝගිතා මෙහෙයුම් ඉල්ලුම් පාර්ශව කළමනාකරණ) නියෝග සකසනු ලැබේ.

රංජිත් සියඹලාපිටිය,
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2016 ජූලි මස 13 දින

L. D. B 3/2009

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 3 වන වගන්තියේ (ආ) සහ (ඌ) ඡේද සමඟ කියවිය යුතු, එකී පනතේ 54 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නිර්දේශ මත විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නියෝග**

1. මේ නියෝග 2016 අංක දරන උපයෝගිතා මෙහෙයුම් ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. (අ) සෑම බෙදාහැරීම් බලපත්‍රලාභියකු විසින් ම සෑම වසර පහකට වරක් තාක්ෂණික සහ ආර්ථික විභව්‍යතා ඇගයීම් වාර්තාවක් සකස්කර කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

(ආ) තාක්ෂණික සහ ආර්ථික විභව්‍යතා ඇගයීම් වාර්තාවේ -

(i) අවශ්‍ය දත්ත ගබඩා සකස් කිරීමේ හැකියාව සැලසීමට අවශ්‍ය කරන ඉල්ලුම් පාර්ශව කළමණාකරණ වැඩසටහන සඳහා ඉලක්කගත පාරිභෝගිකයන්ගේ සහ අවසන් භාවිත කරන්නන්ගේ කණ්ඩායම;

(ii) විශේෂිත තාක්ෂණයන් සහ ඒවායේ භාවිතය සඳහා වෙළඳපොළ විභව්‍යතාවය පිළිබඳ තක්සේරු කිරීම ; සහ

(iii) මූලික කාර්යසාධන දර්ශක හඳුනා ගැනෙන වැඩසටහන ඇගයීමේ පටිපාටි,

ඇතුළත් විය යුතු ය.

(ඇ) මේ නියෝග ප්‍රකාශයට පත් කිරීමේ දින සිට මාස දොළහක් ඇතුළත සෑම බෙදාහැරීම් බලපත්‍රලාභියෙක් විසින් ම පළමුවන තාක්ෂණික සහ ආර්ථික විභව්‍යතා ඇගයුම් වාර්තාව සකස්කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. (අ) එම තාක්ෂණික සහ ආර්ථික විභව්‍යතා ඇගයුම් වාර්තාව ලැබී මාස දෙකක් ඇතුළත කොමිෂන් සභාව විසින් එම වාර්තාව සමාලෝචනය කළ යුතු ය.

(ආ) කිසියම් සංශෝධන අවශ්‍ය වන්නේ නම්, අදාළ පරිදි සංශෝධනයන් සිදු කරන ලෙසට බෙදාහැරීම් බලපත්‍රලාභියාට කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය යුතු ය.

(ඇ) සංශෝධිත වාර්තාව ලැබී මාස දෙකක් ඇතුළත කොමිෂන් සභාව විසින් එය අනුමත කළ යුතු ය.

4. (අ) එකී ඇගයීම් වාර්තාව සඳහා අනුමතය ලබා ගැනීමෙන් පසු, බෙදාහැරීම් බලපත්‍රලාභියා විසින් ඉල්ලුම් පාර්ශ්ව කළමණාකරන ප්‍රධාන සැලැස්ම සකස්කර සමාලෝචනය කිරීම පිණිස කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ආ) කිසියම් සංශෝධනයක් අවශ්‍ය කරනු ලබන්නේ නම්, එසේ සංශෝධනය කරන ලෙස කොමිෂන් සභාව විසින් බෙදාහැරීම් බලපත්‍රලාභියාට විධාන කරනු ලැබිය යුතු ය.

(ඇ) සංශෝධිත ප්‍රධාන සැලැස්ම ලැබී මාස දෙකක් ඇතුළත කොමිෂන් සභාව විසින් එය අනුමත කළ යුතු ය.

5\. (අ) එකී ප්‍රධාන සැලැස්ම සඳහා අනුමතය ලබා ගැනීමෙන් පසු, බෙදාහැරීම් බලපත්‍රලාභියා විසින් නිශ්චිත කාල වකවානු, අයවැය, වියදම්, අභියෝග සහ හානි අවම කිරීමේ පියවර ද ඇතුළත් කරමින් වසරක කාල පරිච්ඡේදයක් සඳහා ඉල්ලුම් පාර්ශ්ව කළමණාකරන වැඩසටහන සකස්කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ආ) එකී ඉල්ලුම් පාර්ශ්ව කළමණාකරන වැඩසටහන ලැබීමෙන් මාස දෙකක් ඇතුළත කොමිෂන් සභාව විසින් එය සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අවශ්‍ය වන්නේ නම්, එය සංශෝධනය කරන ලෙස බෙදාහැරීම් බලපත්‍රලාභියාට නිර්දේශ කරනු ලැබිය හැකි ය.

6\. (අ) එකී ඉල්ලුම් පාර්ශ්ව කළමණාකරන වැඩසටහන සඳහා අනුමතය ලබා ගැනීමෙන් පසු, බෙදාහැරීම් බලපත්‍රලාභියා විසින් එම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු අතර කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ පදනම් කොට, සෑම ඉල්ලුම් පාර්ශ්ව කළමණාකරන වැඩසටහනක් සඳහා ම එම ව්‍යාපෘතිය සම්පූර්ණ වීමෙන් පසු ව්‍යාපෘති වාර්තාවක් සකස් කළ යුතු ය.

(ආ) කොමිෂන් සභාව විසින් සමාලෝචනය කිරීමෙන් පසු බෙදාහැරීම් බලපත්‍රලාභියා විසින් එකී ව්‍යාපෘති වාර්තාව සංශෝධනය කළ යුතු ය.

7\. මෙම නියෝග වල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස :-

''පනත'' යන්නෙන් 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අදහස් වේ;

''කොමිෂන් සභාව'' යන්නෙන් 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අදහස් වේ;

''බෙදාහැරීම් බලපත්‍රලාභියා'' යන්නෙන් ශ්‍රී ලංකා විදුලිබල පනතෙහි දක්වා ඇති පරිදි එම අර්ථයම අදහස් විය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.